# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2276/24 – 2022 අප්‍රේල් 21 වැනි බ්‍රහස්පතින්දා – 2022.04.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය.: 4-3/4/2013/D/574.
ප්‍රා. ලේ. යොමු අංකය.: KLP/LAND/07/19/03.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාවය ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

පුත්තලම දිස්ත්‍රික්කයේ කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඩච්බේ ග්‍රාම නිලධාරී වසමට අයත් සර්වේයර් ජනරාල්ගේ අංක පි. පි. පු 5392, අනුරේඛ අංක-, කැබලි අංක 1, 2 සහ 2018.08.28 දින දරන පිඹුරේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.4367 ක් වූ ආරක්ෂක අමාත්‍යාංශයේ අවශ්‍යතාවය සඳහා මොහොත්තුවාරම නාවික හමුදා අනුබණ්ඩය පිහිටුවීම සඳහා වූ ඉඩම.

| *ඉඩමේ නම* | *විස්තරය* | *හිමිකම් කියන අය* | *ප්‍රමාණය (හෙක්ටයාර්)* |
|---|---|---|---|
| වන්නන්තෝට්ටම් | සර්වේ ජනරාල්ගේ පිඹුරු අංක පි. පි. පු 5392හි කැබලි අංක 1 හා 2, 2018.08.28 දින දරන පිඹුර | සොයාගත නොහැක | කැබලි අංක 01 -0.3103<br>කැබලි අංක 02 -0.1264<br>එකතුව - 0.4367 |


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඉහත සඳහන් ඉඩමට / පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022.06.20 වැනි දින පෙ. ව. 10.30ට කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2022.06.06 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

**ඩී. ඒ. පී. දනන්සූරිය,**
ප්‍රාදේශීය ලේකම්,
කල්පිටිය.

2022 අප්‍රේල් මස 18 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
කල්පිටිය.

EOG 04- 0092